# සුනාමි දේශපාලනය

මෙරට ප්‍රධාන ම ප්‍රශ්නය අන්කිසිවක් නොව සිංහලත්වයට හිමි තැන ලබා නොදීම බව අප කිහිප වතාවක් ම ප්‍රකාශකර ඇත. සුනාමිය නිසා එහි වෙනසක් සිදුවෙතැයි අපි බලාපොරොත්තු නො වෙමු. සුනාමියෙන් පසු තවත් තත්ත්වය බරපතල්වන බව පැහැදිලි ය. ඊනියා සරාවාගමිකකාරයෝ දිවා රෑ නොබලා සිංහලත්වයට හිමි තැන නැතිකිරීමට කටයුතු කරති. සිංහල බෞද්ධ සංස්කෘතිය විනාශකිරීමේ අරමුණින් ම පිහිටුවා ඇති සිරසක් නැති මහරජවරුන්ගේ ආයතනයක් මේ කාර්යයෙහි දී ප්‍රමුඛස්ථානය ගන්නා බව පෙනෙයි. සුනාමියෙන් පසු එකමුතු ලංකාවක් යන සිත් ඇදගන්නා සුළු සටන් පාඨය (එය සටන් පාඨයක් මිස අන්කිසිවක් නොවෙයි) සෑම අවස්ථාවාදියකුගේ ම, බොරුකාරයකුගේ ම, වංචනිකයකුගේ ම මුවග ලෙල දෙයි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ජාතිය ගොඩනැගීම සඳහා මැතිවරණ අවුරුදු පහකට කල්දැමීමේ යෝජනාව මුට්ටිය දැමීම ලෙස රටට ඇතුල් කෙලේ ද සුනාමිය යොදාගනිමිනි. තව අවුරුදු පහකට පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීමට නියමිත නැති බැවින් ඇය ඉන් පැහැදිලිවම අදහස් කෙලේ ජනාධිපතිවරණය කල් දැමීම ය. විධායක අගමැතිනියක වීමේ සිහිනය සුනාමියෙන් සේදී ගිය බැවින් ඇයට දැන් ඇත්තේ ජනාධිපතිනිය ලෙස අවුරුදු කිහිපයක් කල් බැලීමේ චේතනාව පමණකි. එහෙත් ඒ ජා පක්ෂ මේ යෝජනාවට කිසිම සහායක් නොදෙන බැවින් එය ලත් තැනම ලොප්වනු ඇත. කුමාරතුංග මහත්මියට මැතිවරණ කල්දැමීම යනුවෙන් තමා අදහස් කෙළේ පාර්ලිමේන්තු මැතිවරණය ගැන යැයි කිවහැකි වුව ද ඇගේ පාක්ෂිකයන් වුව ද ඒ පිළිගනීවි ද යන්න සැක ය.

මේ අතර නෝර්වේ නියෝජිතවරු රහසේ කොටි හමුවෙති. කොටි සුනාමිය නිසා තම ප්‍රතිපත්ති වෙනස්කරගෙන නැත. අන්තර් පාලන අධිකාරිය සඳහා ඔවුහු දිගින් දිගටම කටයුතු කරති. උතුරු හා නැගෙනහිර පළාත්වල ආණ්ඩුව ආධාර නො බෙදන්නේ යැයි ඔවුහු චෝදනා කළහ. එහෙත් කොටි යැමට පළමුව ඒ පළාත්වල ජනතාවගේ සහන කටයුතු සිදුකෙලේ හමුදාව හා සිංහලයන් ය. ආණ්ඩුවේ පරිපාලන තන්ත්‍රයේ අකාර්යක්ෂමභාවය උතුරට මෙන් ම දකුණු පළාතටත් පොදු ය. කොටින්ට අවශ්‍ය වූයේ කෙසේ හෝ සහන වැඩ පිළිවෙලේ ආණ්ඩුව හා සම කොටස්කරුවකු බවට පත්වීම ය. නිවට ආණ්ඩුව ඒ යෝජනාවට එකඟ වී ඇත. කොටි සංවිධානය සුනාමියෙන් සේදී ගොස් ඇත. අද ප්‍රභාකරන් ජීවත්වන්නේ ඉතා බයෙන් ය. ඔහු සති හතරක් තිස්සේ සැඟවී සිටියේ එබැවින් ය. අවසානයේ ඔහුට එලියට එමේ අවස්ථාව සපයා දුන්නේ සොල්හයිම් ඇතුළු නෝර්වේ නියෝජිතයන් ය. ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව සැපයූ ආරක්ෂාව යටතේ බටහිර ජනමාධ්‍ය උපයෝගී කරගනිමින් සොල්හයිම්ලා ප්‍රභාකරන්ට එලියට එමට අවස්ථාව සැපයූහ. එහෙත් සැමදාමත් එලියේ හැසිරීම තම ජිවිතයට අහිතකර බව ප්‍රභාකරන් දනියි. ඔහු දැන් නෝර්වේ නියෝජිතයන් හමුවන්නේ රහසින් ය. දුර්වල ප්‍රභාකරන් පවත්වාගෙන යනු ලබන්නේ නොර්වේ ඇතුළු බටහිරයන්, කතෝලික පල්ලිය, රාජ්‍ය නොවන දීනයන් හා නිවට ආණ්ඩුව විසින් ය. හරිහමන් ආණ්ඩුවක් තිබිණි නම් සුනාමියෙන් පසුව කළ යුතුව තිබූ ප්‍රධාන කාර්යය වූයේ දුර්වල වූ කොටි සංවිධානය නැතිකර දැමීම ය. ජාතිය ගොඩගැනීමට එයට වඩා හොඳ ආරම්භයක් තිබිය හැකි ද? එහෙත් ජාතිය ගොඩගැනීම, එකමුතුකම ආදිය පට්ටපල් බොරු සටන්පාඨ වූ විට ඒ වෙනුවට කෙරෙන්නේ කොටි ශක්තිමත් කිරීම ය. අද නෝර්වේ ආණ්ඩුවේ හා වෙනත් බටහිර ආණ්ඩුවල මැදිහත්වීමෙන් කෙරෙන්නේ ජාතිය ගොඩගැනීම නොව ප්‍රභාකරන් හා කොටි ගොඩගැනීම ය.

සිංහලත්වයට විරුද්ධ නෝර්වේ ආණ්ඩුව අද අළුත් පොතක් පෙරළයි. බටහිරයෝ ලෝක පොත්කාරයෝ වෙති. කෙහොමටත් අපට පුරුදුකර ඇත්තේ බටහිරයන්ගේ පොත් කියවීමට ය. ඔවුන්ගේ පොත් ඔවුන් කියන ආකාරයටම පේළි අතරින් කියවීමට පුරුදු වූ පසු බටහිරයන්ගේ පොත් හොඳට කියවිය හැකි ය. මෙය සාපේක්ෂක තත්ත්වයක් මිස මෙරට දීන අනුකාරක උගතුන් යැයි කියන පිරිස් නිතර දෙවේලේ කියන ඊනියා තවත් කියවීමක් නො වෙයි. තම තම නැණ පමණට දැනගත යුතු යන ලෝවැඩ සඟරා කවි පදය හරිහැටි කියවුවකුට ඊනියා දෙවැනි හෝ නැවත කියවීම් විවාහ මංගල අවස්ථාවල කෙරෙන ඊනියා දෙවැනි ගමන මෙන් ම විකාරයක් බව වැටහෙනු ඇත. නෝර්වේ ආණ්ඩුව පෙරළන්නේ අමුතු ම පොතකි. දැන් ලූතර්වාදී සිංහල බෞද්ධ විරෝධී සොල්හයිම්ලා පන්සල් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මුදල් ආධාර ලබා දීමට පෙරට එති. ඒ සඳහා පල්ලි නිකායේ මහණුන් පිරිසක් ද පෙරට ගෙන ඇති බව පැහැදිලි ය. පල්ලි නිකායට ලූතර්වාදය, ඇංග්ලිකන් වාදය, මෙතෝදිස්ත ආදී වශයෙන් පමණක් නොව ක්‍රිස්තියානි කතෝලික වශයෙන් ද වෙනසක් නැත.පල්ලි නිකායේ මහණුන්ට විවිධ ආගම්වල පූජකවරුන් නම කියා කතාකරන බව

© Prof. Nalin De Silva

ද රහසක් නො වෙයි. මේ පස්ගව මහණුන්ට පස්වග මහණුන් වහන්සේලාගේ ශ්‍රී නාමය ම ඇතැම් විට යොදාගැනීම බුදු සසුනටම කෙරෙන කැළලක් වෙයි. ලූතරවාදී නෝර්වේ ආධාර නැතිවාට පන්සල් ප්‍රතිසංස්කරණය මෙරට බෞද්ධයනට නොකළ හැකි ද? ඒ සඳහා අවශ්‍ය නම් පිටරට වෙසෙන සිංහල බෞද්ධයන්ගෙන් වුව ද සම්මාදම් ලබාගත හැකි ය. අපේ හාමුදුරුවරුන්ට විදේශ මුදල් නෝට්ටු ටිකක් බෙදා දී සිංහලත්වයේ මිනීපෙට්ටියට අන්තිම ඇණය ගැසීමට බලාපොරොත්තුවන්නන්ට ඉඩදිය යුතු නො වෙයි.

සුනාමිය නිසා එකතුවන ලෙස යදින යාඥාකාරයෝ මෙරටට හෙලිකොප්ටර් යානා ගෙනෙති. ඒ කාට දැයි නොකියති. සුනාමියට මුදල් එකතුකිරීමට ක්‍රිකට් තරඟ පැවැත්වීම සදාචාරාත්මක ද යන්න ගැටළුවකි. සුනාමි ආධාර එකතුකිරීමට සංගිත සන්දර්ශන පැවැත්වීම හරිදැයි මම නො දනිමි. සංගීත සන්දර්ශන පැවැත්වීම වැරදි නම් ක්‍රිකට් තරඟ පැවැත්වීම නිවැරදි වන්නේ ඇරිස්ටෝටල්ගේ හෝ තෝමස් ඇක්වයිනාස්ගේ කිනම් තර්කයකට අනුවද යන්න ද නො දනිමි. ඒ අතර කලාකාරයෝ ද කතෝලික කලා සංවිධානයක සම්මාන උළෙලකට සහභාගි වීමට අමතක නො කළහ. ඔවුන් සමහරවිට උළෙලේදී විනාඩියක් නිශ්ශබ්ද වන්නට ඇත. කෙසේ වෙතත් අපේ ඇතැම් ක්‍රීඩකයන් පිරිත්නූල් බැඳගෙන ක්‍රීඩාකිරීමේ වාසිය වර්ල්ඩ් විෂන් ආයතනයට ලැබී ඇත. වර්ල්ඩ් විෂන් ආයතනය යනු මුළු ලෝකයටම දැක්මක් ගැන කතාකරන ආයතනයකි. පසුගිය දා ඒ ආයතනයට විරුද්ධව නොයෙකුත් චෝදනා තිබුණි. ඒ ක්‍රිස්තියානි නොවන්නන් ක්‍රිස්තියානියට හැරවීම සම්බන්ධයෙන් ය. ඒ ආයතනය ඒ චෝදනා ප්‍රතික්ෂේප කර තිබෙනු වාර්තා වී ඇත. එහෙත් මෙරට තිබෙන නිවට ආණ්ඩුව ඒ චෝදනාවල ඇත්තක් තිබේ ද නැත්ද යන්න සොයා නොබලයි. අඩුම තරමෙන් බෞද්ධ සංවිධානවලට ද කමිටුවක් පත්කර ඒ ගැන සොයාබැලීමට නො හැකි විය. මේ සුනාමි ක්‍රිකට් තරඟ සංවිධානයකිරීමේ දී ම වර්ල්ඩ් විෂන් ආයතනය සමග යම් ගිවිසුමකට එළඹී ඇති බව පැහැදිලි ය. සුනාමිය පසුපස එන සුනාමි ගණනාවක් ඇත. සුනාමියෙන් වූ එකම යහපත මුරලිදරන් හා  වෝන් මිත්‍ර වීම ද?

කැලණිතිස්ස රජු සමයෙහි ඇතිවූයේ සුනාමියක් ද යන්න පිළිබඳ ව ප්‍රශ්න වෙයි. සෑම මුහුද ගොඩගැලීමක් ම සුනාමියක් විය යුතු නැත. එසේම සුනාමි ඇතිවන්නේ ද භූතැටි එකිනෙක සමග ගැටීම නිසා හටගන්නා ආවේග (ඉම්පල්ස්) නිසා පමණක් නො වෙයි. උල්කාපාත වැටීමෙන් ද, න්‍යෂ්ටික පිපිරවීම් මගින් ද එවැනි ආවේග ඇතිවිය හැකි ය. එසේම භූමිකම්පා ප්‍රේරණය කිරීම් ගැන අත්හදා බැලීම් ද බටහිර විද්‍යාවේ කෙරෙන බව අමතක නොකළ යුතු ය. අප දන්නා බටහිර විද්‍යාවේ සෝචිචම් දැනුමෙන් අපට කුමකින් කුමක් වුවාදැයි තනිව තේරුම් ගැනීමට නො හැකි ය. කැලණිතිස්ස රජු සමයෙහි දී ද ඇති වූයේ සුනාමියක් යැයි කියන්නට ඉක්මන්වන්නවුන්ට කිවයුතු කරුණක් නම් ජලයේ ස්වභාවය යහපත් වචනයෙන් හා සිතිවලින් වෙනස්කළ හැකි බවට ජපානයේ කෙරෙන පර්යේෂණවලින් හෙළිවන බව ය. මේ පිළිබඳ විස්තර හැඩෝ නමින් ඇති වෙබ් අඩවියෙන් ලබාගත හැකි ය. ද්‍රව්‍ය ලෝකය හා අද්‍රව්‍ය ලෝකය අතර ඇති සම්බන්ධතාවය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අතිජාත දරුවකු වූ ඩෙකාට්ගේ තාප්ප දර්ශනය පසුපස යන බටහිරයන්ට නො තේරෙයි. ඒ කෙසේවෙතත් මෙයට අවුරුදු පන්සියයකට පෙර නම් මෙරටට සුනාමියක් පැමිණ ඇත. ඒ පෘතුගීසි සුනාමියයි. ඒ සුනාමිය ද පැමිණියේ මුහුදෙන් ය. කෙසේ හෝ ආසියාකරයට පෘතුගීසි සුනාමිය පැමිණ අවුරුදු පන්සියයකට පසුව තවත් සුනාමියක් ආසියාකරයට පැමිණීම නම් ගැටළුවකි. පෘතුගීසීන් සමග පැමිණියේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව සුනාමියයි. මේ සුනාමියේ බරපතලකම දැනෙන නිසාදෝ ඇතැම් කතෝලික පූජකවරු තම ආගම අනුරාධපුර යුගයේ සිට පැවත එන බවට බොරු කතා ගොතති. අනුරාධපුරයේ නෙස්ටෝරියන් කුරුසය යැයි හැඳින්වෙන කුරුසයක් තිබූ පමණින් එකල ලංකාවේ සිංහල ක්‍රිස්තියානීන් සිටි බව ගම්‍ය නො වෙයි. ඒ කුරුසයේ දින වකවානු ගැන පළමුව පරීක්ෂා කළ යුතු ය.  දෙවනුව එකල මෙරට පල්ලියක් තිබුණේ දැයි සෙවිය යුතු ය. ඒ කුරුසය අනුරාධපුර කාලයට අයත් නම් ඒ මෙරටට පැමිණි පර්සියන් හෝ වෙනත් වෙළෙන්දන්ගේ හෝ තානාපතියන්ගේ නොවේ යැයි සැකහැර දැනගත යුතු ය. එකල මෙරට සිංහල ක්‍රිස්තියානි බැතිමතුන් සිටි බවට, සිංහලයන් ක්‍රිස්තියානි කිරීමට එවන ලද මිසම් ගැන සඳහන් ඓතිහාසික ප්‍රවෘත්ති වෙනත් රටවල තිබේදැයි සොයා බැලිය යුතු ය. එදා සිට පෘතුගීසින් පැමිණෙන තෙක් පල්ලි නොසෑදුයේ නම් ඒ මන්දැයි සොයා බැලිය යුතු ය. එදා සිට ක්‍රිස්තියානියේ බලපෑම හේතුවෙන් සිංහල සංස්කෘතිය වෙනස්වී ඇත්තේ කෙසේ දැයි විස්තර කළ යුතු ය. මේ කිසිවක් නොකර ක්‍රිස්තියානිය අනුරාධපුර කාලයේ සිට මෙරට ආගමක් ලෙස තිබූ බව ප්‍රකාශ කරන්නේ සිංහල බෞද්ධ සංස්කෘතියට හිමිතැන අහිමි කිරීමේ සුනාමි දේශපාලනය වෙනුවෙන් ය.

© Prof. Nalin De Silva